## හැඳින්වීම

මිනිසා වූ කලී තොරතුරු සාපිපාසාවෙන් පෙළෙන සත්ත්වයෙකි. එම සාපිපාසාව සංසිඳුවා ගැනීම සඳහා අතීතයේ පටන් නොයෙක් ආකාරයේ විධික්‍රම අනුගමනය කරන්නට මිනිසා හුරු විය. අත් පා චලනය, හඬ භාවිතය නොයෙකුත් සංඥා සංකේත භාවිතය ඒ අතර දක්නට ලැබෙන මූලික භාවිතාවන් කිහිපයකි. අතීතයේ භාවිතා කරන ලද මෙම සන්නිවේදන ක්‍රමවේදයන් තාක්‍ෂණයේ දියුණුව ද ගුරුකොට ගනිමින් ක්‍රමිකව විකාශනය වන්නට විය. එකී විකාශනයේ එක් අග්‍ර ඵලයක් ලෙස රූපවාහිනිය හැඳින්වීමට පුළුවන. කළු සුදු රූපවාහිනියෙන් ඇරඹි මෙම සන්නිවේදන මාධ්‍ය වර්ණ රූපවාහිනිය දක්වා සීඝ්‍ර වර්ධනයක් හිමිකරගෙන ඇත. තොරතුරු බෙදා හැරීමේ මෙවලමක් ලෙස ඇරඹි රූපවාහිනිය වර්තමානයේ කලා මාධ්‍යයක් බවට පරිවර්තනය වී ඇති බව පෙනේ. එසේම ලාංකේය රූපවාහිනිය තුළ අද්‍යතනය වන විට රූපවාහිනී නාලිකා බොහෝ ප්‍රමාණයක් දක්නට ලැබේ. ප්‍රේක්‍ෂක ආකර්ෂණය රඳවා තබාගැනීමේ අටියෙන් මෙම නාලිකා ප්‍රබල තරඟයකට මුහුණ දී තිබේ. එම තරඟකාරීත්වය ජය ගැනීමට නොයෙකුත් ආකාරයේ වැඩසටහන් ඉදිරිපත් කිරීම සිදු කරයි. එහිදි වැඩසටහනෙහි ගුණාත්මකභාවය, අලංකාරය , ආකර්ෂණය ඉස්මතු වන ආකාරයෙන් වැඩසටහන ඉදිරිපත් කරයි.

පෙර පැවති කලාවන්ගේ අනු කොටස් උපයුක්ත කොටගනිමින් තාක්‍ෂණික වශයෙන් සන්නද්ධව වැඩසටහන් නිර්මාණය සිදුකරයි. එහිදී "පසුතල නිර්මාණකරණය" වැඩසටහනෙහි ප්‍රවර්ධනයට යොදාගනු ලබන ආනුෂංගික කලා අංගයකි. පසුතල නිර්මාණකරණය ඈත අතීතයේ පටන් පැවත එන ආනුෂංගික කලාවකි. නාට්‍ය කලාව හා මුසුව ආනුෂංගික අංගයක් ලෙස බිහිවන මෙම පසුතල නිර්මාණකරණය වර්ණ, රේඛා, හැඩතල, අමුද්‍රව්‍ය,ආලෝකය මත පදනම් වෙමින් බිහිවේ. පසුතල නිර්මාණකරණය රූපවාහිනිය දක්වා ගමන් ඇරඹීමට පෙර නාට්‍ය කලාව ඔස්සේ උත්පත්තිය සනිටුහන් කරමින් බිහිවේ. ග්‍රීක,රෝම නාට්‍ය කලාවන් තුළින් සංකල්පීය බීජයක් ලෙස ඉස්මතු වෙමින් මධ්‍යකාලීන යුගයේදී චිත්‍ර වස්ත්‍රයන් බවට පරිවර්තනය වී එතැන් පටන් ස්වාභාවික වාදය, යථාර්ථවාදය, ප්‍රකාශනවාදය ඔස්සේ විවිධ ශෛලීන්ගෙන් යුත් පසුතල නිර්මාණයන් බිහිවන්නට විය. ලෝක නාට්‍ය කලාව තුළ පසුතල මේ ආකාරයෙන් සංවිධිත වන විට ලාංකේය ජනයාගේ පුද පූජා ඇදහිලි තුළ ප්‍රාසංගිකත්වය ඉස්මතු කර දැක්වීම සඳහා පසුතල නිර්මාණකරණය යොදාගනු ලැබිණි.

ඉතාම සරළ අමුද්‍රව්‍ය භාවිතා කරමින් ස්වාභාවිකත්වයට මුල්තැන දෙමින් දේශීයත්වය ආරක්‍ෂාවන පරිදි පසුතල නිර්මාණයන් සිදුකරන්නට විය. මෙකල පසුතල නිර්මාණකරණය නාමික වශයෙන් ආනුෂංගික කලාවක් ලෙස ලෙස යොදා නොගැනුන ද පූජාර්ථයෙන් හෝ එය සිදුවන්නට විය. ලාංකේය නාට්‍ය කලාව බිහිවීමත් සමඟ චිත්‍ර වස්ත්‍ර භාවිතය, පසුතල නිර්මාණකරණය, රංග භාණ්ඩ නිර්මාණයකරණය ක්‍රමිකව සංවර්ධනය විය. අද්‍යතනය වන විටද එහි සාධනීය ලක්‍ෂණ ගොඩනැගෙමින් පවතී. පසුතල නිර්මාණ ශිල්පීන් මෙම ආනුෂංගික කලාව විධිමත් ලෙස භාවිතා කිරීම සඳහා නොයෙකුත් ක්‍රමවේදයන් භාවිතා කරයි. එහිදී නිර්මාණාත්මක අංශය පිළිබඳ මනා අවබෝධයක් සහිතව දළ සටහන් ඇඳීම, භූමි සැලැස්ම නිර්මාණය, ආකෘති ගොඩනැංවීම යන මූලික අදියරයන් සිදු කෙරේ. මෙම සටහන් පසුතල නිර්මාණය සාර්ථක කරගැනීමට මනා දායකත්වයක් සපයයි.

පසුතල නිර්මාණකරණයේ ආගමනය රූපවාහිනිය තුළද ක්‍රමිකව ක්‍රියාත්මක වනවිට පසුතල නිර්මාණ ශිල්පීන් එය රූපවාහිනී කැමරාවට උචිත වන පරිදි අලංකාරයෙන් යුතුව, වර්ණ භාවිතා කරමින්, ආලෝකරණය ඉතාම ප්‍රබල ලෙස යොදා ගනිමින් නිර්මාණය සිදුකරයි. රූපවාහිනී පසුතල නිර්මාණය ඉතාම සූක්‍ෂම ලෙස නිර්මාණය කළ යුත්තකි. අපගේ පියවි ඇසට නොපෙනෙන බොහෝ දෑ කැමරා ඇස තුළින් ග්‍රහණය කරගැනීමට ද, අපගේ පියවි ඇසට පෙනෙන අනවශ්‍ය බොහෝ දෑ ඉවත්කර දැමීම ව කැමරාව මගින් සිදුකළ හැක.

මෙම විද්‍යුත් මාධ්‍ය සඳහා පසුතල නිර්මාණයේදී පසුතල නිර්මාණ ශිල්පියෙකු හෝ කලා අධ්‍යක්‍ෂවරයෙකු විසින් පසුතල නිර්මාණය මෙහෙයවනු ලැබේ. රූපවාහිනිය සඳහා පසුතලයන් නිර්මාණය කිරීමේදී වැඩසටහනෙහි සංකල්පය මනාම තේරුම්ගත යුතු වේ. පසුතල නිර්මාණකරණය යනු ගැටළු විසඳීමේ එක් ක්‍රමවේදයකි. මෙම ක්‍රමවේදය භාවිතා කරමින් වැඩසටහනට අදාළවන පරිදි නිර්මාණය සිදුකොට ඉන් අනතුරුව ගොඩනැංවීම, නිමාව සිදුකරනු ලැබේ. රූපවාහිනි වැඩසටහන් විකාශනයන් තුළ නොයෙක් ආකෘතීන් ගෙන් යුත් වැඩසටහන් රාශියක් විකාශනය වන අතර මෙම වැඩසටහන් ආකෘති ලෙස ප්‍රවෘත්ති, ළමා, කාලීන ,කාන්තා, ක්‍රීඩා, රියැලිටි, සංගීත වැඩසටහන් ආකෘති ආදී වශයෙන් දැක්විය හැක. මෙවැනි ආකෘතීන්

අමු ද්‍රව්‍ය, කැමරා ස්ථානගත කිරීම, පසුතලය ඉදිකරනු ලබන වපසරිය, පිළිබඳව පූර්ණ අවබෝධයක් සහිතව නිර්මාණ ශිල්පියා සතු සහජ හැකියා කුසලතාවන් ද යොදා ගනිමින් පසුතල නිර්මාණකරණය සුමට, කලාත්මක නිර්මාණයක් බවට පරිවර්තනය කෙරේ.

මෙම පර්යේෂණ නිබන්ධනයෙන් ලාංකේය රූපවාහිනී වැඩසටහන් හි පසුතල නිර්මාණකරණයේ ස්වරූපය පිළිබඳ අධ්‍යයනයක් සිදුකරනු ලැබේ. මෙහිදී ලාංකේය රූපවාහිනී නාලිකාවන් ඔස්සේ ඉදිරිපත් කරනු ලබන වැඩසටහන්වල පසුතලය එම වැඩසටහනේ තේමාවට අනුව ගොඩනැගී ඇති ආකාරය, පසුතලයන් නිර්මාණය කර ඇති ක්‍රමවේදයන් පිළිබඳව, වර්ණ භාවිතය සිදුකරන ආකාරය පිළිබඳව, විශේෂ ප්‍රයෝග යොදාගැනීම, ගුණාත්මක භාවය ආරක්ෂා කරගැනීම සිදුකරනු ලබන ආකාරය, පසුතල භාවිතයේ අතීතය සහ වර්තමානය තෙක් විකාශනය පිළිබඳව අධ්‍යයනය කිරීමට ද අපේක්ෂා කරමි.

අද්‍යතන ශ්‍රී ලාංකේය රූපවාහිනී වැඩසටහන් හි පසුතල නිර්මාණකරණයේ ස්වරූපය පිළිබඳ අධ්‍යයනයක් යන මාතෘකාව යටතේ මේ වනතෙක් පර්යේෂණාත්මකව නිබන්ධනයක් සිදුකර නොමැති බැවින් මාගේ පර්යේෂණ නිබන්ධනය ලෙස මෙම ක්ෂේත්‍රය තෝරා ගතිමි. මා විසින් සිදුකිරීමට නියමිත මෙම පර්යේෂණය මේ සම්බන්ධයෙන් උනන්දුවක් දක්වන විශ්වවිද්‍යාල සහ වෙනත් උසස් අධ්‍යාපන ආයතනවල විද්‍යාර්ථීන්ට ද මඟ පෙන්වීමක් වන අතරම මාගේ ඉදිරි අධ්‍යයන කටයුතු සඳහා ද මෙම පර්යේෂණය ශක්තිමත් පදනමක් වනු ඇතැයි අපේක්ෂා කරමි.